ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,599 – 2009 අප්‍රේල් මස 24 වැනි සිකුරාදා – 2009.04.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

I වැනි කොටස : (II අ) වැනි ඡෙදය - පළකිරීම්

තනතුරු – ඇබෑර්තු

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - රත්නපුරය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 මැයි මස 25 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 මාර්තු මස 24 වැනි දින,
අංක 234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර	ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය
රත්නපුරය	කිරිඇල්ල	රත්නපුරය දිස්ත්‍රික්කයේ දොඩම්පේ කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා කුරුවිට කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය/උඩරට) රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුරය.

04-516

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
ඉංජිනේරු තාක්ෂණ ආයතනය (පෙර තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනය) - කටුනායක
ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම - 2009 කණ්ඩායම

කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ (පෙර තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනය) ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව, 2009 කණ්ඩායම සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

පහත දක්වා ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැක :-

1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී විද්‍යාව, ගණිතය සහ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 06කින් සාමාර්ථය ලබා සිටීම ;

සහ

1.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ - නව නිර්දේශය) විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් තුන (03) එකවර සමත්වීම.

2. *වයස.*- 2009.12.01 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 25ට නොවැඩි විය යුතුය.

3. *පුහුණු කිරීමේ කාලය පිළිබඳ වැඩසටහන් විස්තර :*

මෙම පාඨමාලාවේ කාලය වසර හතරකි. මාස 18ක න්‍යායික උපදෙස් පාඨමාලාව, මාස 30ක ප්‍රායෝගික පුහුණුව සමග පහත දැක්වෙන ආකාරයට සකස් කර ඇත :-

මූලික උපදෙස් වැඩසටහන ඉංජිනේරු තාක්ෂණ (ඉ.තා.) ආයතනයේ දී	- මාස 06
මූලික ආයතනික ක්ෂේත්‍ර පුහුණුව කර්මාන්ත ආයතනයේ දී	- මාස 12
සාමාන්‍ය උපදෙස් වැඩසටහන ඉ. තා. ආයතනයේ දී	- මාස 06
සාමාන්‍ය ආයතනික ක්ෂේත්‍ර පුහුණුව කර්මාන්ත ආයතනයේ දී	- මාස 12
විශේෂ උපදෙස් වැඩසටහන ඉ. තා. ආයතනයේ දී	- මාස 06
විශේෂ ආයතනික ක්ෂේත්‍ර පුහුණුව කර්මාන්ත ආයතනයේ දී	- මාස 06

මෙම ඉංජිනේරු පාඨමාලාවට අයත් න්‍යායික උපදෙස් හා පාඨමාලා ප්‍රායෝගික කාර්යයන් මෙම ආයතනයේදී ලබා දෙන අතර ආයතනික ක්ෂේත්‍ර පුහුණුව පිළිගත් කර්මාන්ත ආයතන මගින් ලබා දෙනු ඇත.

පාඨමාලාව ආරම්භ කිරීමට ප්‍රථම පැය 100ක කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාවක් පවත්වනු ලබන අතර එයට තෝරාගත් සියළුම ආධුනිකයින්ගේ සහභාගිත්වය අනිවාර්ය වේ.

4. ආයතනය මගින් පවත්වනු ලබන පාඨමාලා පහත සඳහන් පරිදි වේ :-

(අ) සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය :
1. ගොඩනැගිලි හා වපුහ ඉංජිනේරු පාඨමාලාව
2. මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉංජිනේරු පාඨමාලාව
3. ජල හා පාරිසරික ඉංජිනේරු පාඨමාලාව

(ආ) විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය :
4. විද්‍යුත් ඉංජිනේරු පාඨමාලාව
5. විදුලි බල ඉංජිනේරු පාඨමාලාව
6. විදුලි සංදේශ ඉංජිනේරු පාඨමාලාව

(ඇ) යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රය :
7. යාන්ත්‍රික (ස්වයංචලන) ඉංජිනේරු පාඨමාලාව
8. යාන්ත්‍රික (සාමාන්‍ය) ඉංජිනේරු පාඨමාලාව
9. නාවික ඉංජිනේරු පාඨමාලාව

(ඈ) පරිගණක ඉංජිනේරු ක්ෂේත්‍රය :
10. පරිගණක මෘදුකාංග ඉංජිනේරු පාඨමාලාව
11. පරිගණක දෘඩාංග හා ජාලකරණ ඉංජිනේරු පාඨමාලාව

(අ) ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ නාවික ඉංජිනේරු පාඨමාලාව (අංක 9) තත්ත්ව කළමනාකරණ පද්ධතිය ISO 9001-2000 හි දක්වා ඇති අවශ්‍යතා පරිදි පැවැත්වේ.

(ආ) නාවික ඉංජිනේරු පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ අන්තර්ජාතික සමුද්‍ර සංවිධානයේ STCW-95 සහ 7.04 ආදර්ශ පාඨමාලාව හා සම්බන්ධිත නාවික ඉංජිනේරු කාරක මට්ටමේ දැනුම, අවබෝධය සහ ප්‍රවීණතාව පිළිබඳ විධානානුකූල අවශ්‍යතා සපුරාලනු පිණිස වේ.

5. *උපදෙස් මාධ්‍යය.*- මෙම පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි භාෂාවෙනි.

6. *ආධුනිකත්ව ගිවිසුම :*

6.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකු විසින්ම ආධුනිකයා, ඉංජිනේරු තාක්ෂණ ආයතනය සහ පුහුණු කිරීමේ ආයතනය යන තිදෙනා වෙතම අන්‍යෝන්‍යය වගකීම් පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ දී, පාඨමාලාව අවසානයේ ආපසු ගෙවනු ලබන රුපියල් 5,000ක තැන්පතු මුදලක් ලබා දිය යුතුය. පාඨමාලාව අතරමග හැර යන සිසුන්ට මෙම මුදල ආපසු ගෙවනු නොලැබේ.

6.2 කර්මාන්ත පුහුණු අවස්ථාවල දී ආධුනිකයා සහ පුහුණු ආයතනය අතර ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

6.3 පුහුණුව අවසාන වීමෙන් පසුව ආධුනිකයින් සඳහා රැකියා සැපයීමට ආයතනය බැඳී නොමැත.

6.4 මෙම පාඨමාලා සඳහා ලියාපදිංචි වන සියළුම සිසුන් මුළු පාඨමාලා කාලය තුළ 80% අවම පැමිණීමේ ප්‍රතිශතයක් පවත්වාගෙන යා යුතුය. එසේ නොවන අවස්ථාවල දී අදාල විභාගවලට පෙනී සිටිය නොහැකි අතර ඔවුන්ට එම කණ්ඩායමෙන් ඉවත්වී පසු කණ්ඩායම සමග අධ්‍යයන කටයුතු කිරීමට සිදුවේ.

7. *සහතික ප්‍රදානය.*- සාර්ථක ලෙස පුහුණුව අවසන් කර සමත්වන ආධුනිකයින් හට ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ඇත.

8. *තෝරාගැනීමේ ක්‍රමය :*

8.1 ඉහත අංක 1 ඡේදයෙහි සඳහන් ඇතුළත් කර ගැනීම සඳහා වූ අවම සුදුසුකම් සහිත අංක 2 ඡේදයෙහි සඳහන් වයස සීමාව තුළ වූ අයදුම්කරුවන්ගෙන් පහත දැක්වෙන ක්‍රමයට තෝරාගැනීම සිදුකරනු ලැබේ.

8.2 මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් වූ ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. (ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන සියලුම අයදුම්කරුවන් වෙත කල්වේලා ඇතිව ඒ බව දැනුම් දෙනු ලැබේ).

8.3 ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු හා සම්මුඛ පරීක්ෂණයක් මගින් විවිධ ක්ෂේත්‍ර/විශේෂීකරණ සඳහා ආධුනිකයින් තෝරාගනු ඇත.

8.4 නාවික ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා තෝරාගනු ලැබූ අයදුම්කරුවන් ඔවුන් එම ක්ෂේත්‍රයේ ලියාපදිංචි වීමට පෙර ඔවුන්ගේ වියදමින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

9. *අයදුම්පත් :*

9.1 අයදුම්පත් සහ ආයතනය පිළිබඳ වැඩි විස්තර www.iet.edu.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක. තව ද,

9.2 කටුනායක, පන්සල පාරේ, ඉංජිනේරු තාක්ෂණ ආයතනයට පැමිණ රු. 50ක් ගෙවීමෙන් හෝ තැපෑලෙන් අවශ්‍ය නම් රු. 50ක් වටිනා මුදල් ඇණුවුමක් සහ මුද්දර ගැසූ ලිපිනය ලියන ලද අඟල් 9X4 ප්‍රමාණයේ ලියුම් කවරයක් ලේඛකාධිකාරි, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක (දුරකථන අංක (011-2252833, 011-2252834) යන ලිපිනයට එවීමෙන් 2009 ජූනි මස 16 වැනි දින දක්වා අයදුම්පත් ලබාගත හැක. මුදල් ඇනවුම් : ගණකාධිකාරි, ඉංජිනේරු තාක්ෂණ ආයතනය නමින් ලබාගතයුතු අතර ගෙවීම් කරන තැපැල් කාර්යාලය 'කටුනායක' විය යුතුයි.

9.3 මෙයට අමතරව පහත දැක්වෙන ප්‍රධාන කාර්යාලවලට පැමිණ රු. 50ක් ගෙවීමෙන් ද, 2009 ජූනි මස 16 වැනි දින දක්වා අයදුම්පත් මිල දී ගත හැක.

(i) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
දුරකථනය : 011-2863680, 011-2867435

(ii) ආධුනිකත්ව අභ්‍යාස ආයතනය, අංක 581, ගාලුපාර, කටුබැද්ද, මොරටුව.
දුරකථනය : 011-2647393, 011-2641092

(iii) මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, 07,දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.
දුරකථනය : 011-2572977, 011-2532182

(iv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ඌව පළාත් කාර්යාලය, අංක 288, කුමාරසිංහ මාවත, පස්සර පාර, බදුල්ල.
දුරකථනය : 055-2222608

(v) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, සබරගමුව පළාත් කාර්යාලය, නව කොළඹ පාර, විද්‍යාල මාවත, නව නගරය, රත්නපුර.
දුරකථනය : 045-2228667

(vi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, දකුණු පළාත් කාර්යාලය, අංක 27ඒ, විවෘත විශ්වවිද්‍යාල මාවත, නූසේ, මාතර.
දුරකථනය : 041-2226958

(vii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, අංක 108/2බී, තිවංක බෝධි මාවත, මුල්ගම්පොළ, මහනුවර.
දුරකථනය : 081-2201918

(viii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, උතුරු මැද පළාත් කාර්යාලය, දෙවන පියවර, ගුවන් තොටුපල පාර, අනුරාධපුරය.
දුරකථනය : 025-2223178

(ix) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, වයඹ පළාත් කාර්යාලය, ජාතික තරුණ සේවා සභාව අසල, මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල.
දුරකථනය : 037-2221865/037-2223789

(x) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, උතුරු පළාත් කාර්යාලය, අංක 07, කෝවිල පාර, යාපනය.
දුරකථනය : 021-2222383

(xi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, නැගෙනහිර පළාත් කාර්යාලය, අංක 06, ග්‍රාමසේවක පාර, කල්මුනේ කුඩි 13, කල්මුනේ.
දුරකථනය : 067-2229357

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 අප්‍රේල් මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 අප්‍රේල් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

ලක්ෂමන් ගුණවර්ධන,
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

(xii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය, බස්නාහිර පළාත් කාර්යාලය, අංක 242, හැව්ලොක් පාර, කොළඹ 05.
දුරකථනය : 011-2597671-2, 011-2587258

දිස්ත්‍රික් කාර්යාල :

(i) විදුලි සංදේශ හා පරිගණක පුහුණු මධ්‍යස්ථානය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, බේරුවල.
දුරකථනය : 034-2279710

(ii) ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 56, ආනන්ද මාවත, ගම්පහ.
දුරකථනය : 033-2227501

(iii) දිස්ත්‍රික් කාර්යාලය (පුත්තලම), පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, ඉහළගම, මාදම්පේ.
දුරකථනය : 032-2247776

(iv) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක ඒ/6, මහවැලි නිල නිවාසය, නව නගරය, පොළොන්නරුව.
දුරකථනය : 027-2223023

(v) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, කච්චේරිය, මොණරාගල.
දුරකථනය : 055-2276504

(vi) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 1/6, ඉහළ වැව පාර, නුවරඑළිය.
දුරකථනය : 071-4408182

(vii) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 32, මල්වත්ත පාර, මාතලේ.
දුරකථනය : 066-2230355

(viii) දිස්ත්‍රික් කාර්යාලය, කෑගල්ල, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 450 - ඒ, නුවර පාර, මිපිටිය, කෑගල්ල.
දුරකථනය : 035-2223127

(ix) ශ්‍රී සරණංකර ආධුනිකත්ව පුහුණු ආයතනය, උඩවත්ත, බද්දේගම.
දුරකථනය : 091-5677388

(x) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 14, ඉඳිපොකුණගොඩ පාර, තංගල්ල.
දුරකථනය : 047-2241512

(xi) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 06 ජී/එස් පෙදෙස, කල්මුනිකුඩයි 13, කල්මුනේ.
දුරකථනය : 067-2229357

(xii) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 33/1, ප්‍රධාන වීදිය, ත්‍රිකුණාමලය.
දුරකථනය : 026-2222891

(xiii) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 16/1, නව කල්මුනෙයි පාර, මඩකලපුව.
දුරකථනය : 071-6894457

(xiv) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 27/4/4, පදනිච්චිපුලියන්කුලම, මන්නාරම පාර, වවුනියාව.
දුරකථනය : 024-2220442

(xv) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 25, ප්‍රධාන පාර, කොටුව, මන්නාරම.
දුරකථනය : 021-2222383

9.4 සෑම අයැදුම්කරුවෙකු විසින්ම තම අයදුම්පත ඉදිරිපත් කිරීමේ දී රු. 300ක මුදලක් (9.5 ප්‍රකාර) ගෙවිය යුතු ය. මෙම මුදල දිවයිනේ පිහිටි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවිය හැකි ය.

9.5 මුදල් තැන්පතු තුණ්ඩුව පහත සඳහන් කරුණු සහිතව නිසි පරිදි සම්පූර්ණ කළ යුතු ය :-

(i) *ශාඛා අංකය සහ ගිණුම් අංකය* : 174-100170347379

(ii) *බැර උපදෙස්*.- මහජන බැංකුව, නුගේගොඩ, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ රැස් කිරීමේ ගිණුම් අංක 174-100170347379ට බැර පිණිස.

(iii) අයදුම්කරුගේ නම සහ ලිපිනය

9.6 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, මුදල් ගෙවීම් කරන ලද බැංකු ශාඛාවේ බලයලත් නිලධාරියෙකු විසින් සහතික කරන ලද තැන්පතු රිසිට්පත, අයදුම්පත සමග අමුණා 2009 ජූනි 20 මස වැනි දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ/විදුහල්පති, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක යන ලිපිනයට එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හෝ අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

9.7 රජයේ කාර්මික ආයතනයක හෝ විශ්වවිද්‍යාලයක පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ උපාධිය හැදෑරූ හෝ හදාරමින් සිටින අය හෝ අයදුම්කිරීමට සුදුසුකරුවන් නොවේ.

9.8 අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් හෝ ඡායා පිටපත් එවිය යුතු නැත.

9.9 අයදුම්පත් ලැබුණු බවට අයදුම්කරුවන්ට දැනුම් දෙනු නොලැබේ.

10. තැපෑලේ දී නැතිවන හා ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් ඉංජිනේරු තාක්ෂණ ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා කල් ඇතිව සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

අංක 971,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.
04-561

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

බඩු බාහිරාදිය විකිණීම්

සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - මැදවච්චිය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ, හිමිකම් නොපාන ලද, නඩු අංක මැකී ඇති, නඩු වාර්තා සොයා ගැනීමට අපහසු, නඩු අංක සොයා ගැනීමට අපහසු, භාණ්ඩවල අංක මැකී ඇති පහත සඳහන් භාණ්ඩ 2009.05.16 වැනි සෙනසුරාදා දින පෙ. ව. 9.30 ට මැදවච්චිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන්නේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ එදින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසි දින නියමිත වේලාවට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ එවෙලේ ම මුදල් ගෙවා ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා ගැණුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරි අවසන් වීමට පෙර අධිකරණය වෙත දැන්විය යුතු අතර, ඊට පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

08. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

රුචිර වැලිවත්ත,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
අනුරාධපුරය.

2009 පෙබරවාරි මස 25 වැනි දින,
අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

අනු අංකය	නඩු අංකය	විස්තරය
01.	65181	වයර් මීටර් 70 පමණ අඩංගු රෝල් එකයි
02.	65182	වයර් මීටර් 25 පමණ අඩංගු රෝල් එකයි
03.	65183	වයර් මීටර් 20 පමණ හා බල්බ් එකක් හා හෝල්ඩර් එකක් අඩංගු පාර්සල් එකයි
04.	අංක රහිත	වයර් මීටර් 50 බහු පේනු 02යි
05.	අංක රහිත	වයර් මීටර් 04 බහු පේනු එකයි
06.	අංක රහිත	වයර් මීටර් 250 පමණ අඩංගු රෝල් එකයි
07.	අංක රහිත	වයර් මීටර් 200 පමණ අඩංගු රෝල් එකයි
08.	65958	වයර් මීටර් 20 පමණ අඩංගු රෝල් එකයි
09.	65959	වයර් මීටර් 15 පමණ අඩංගු රෝල් එකයි
10.	67548	උදලු 01යි, සවල් 01යි
11.	64450	කැති 01යි, පොරෝ 02යි
12.	63833	පොරෝ 2යි, අලවංගු එකයි, බූලි 02යි
	63833	කොහු කඹ එකයි
13.	67574	උදලු 01යි
	67576	සවල් 01යි
14.	78597	තරාදි එකයි
	78597	කිලෝ ග්‍රෑම් 1 පඩි එකයි
15.	78579	උදලු එකයි
	78579	සවල් එකයි
16.	62187	සවල් 02යි
17.	62186	සවල් 01යි
18.	66278	සවල් 01යි
	66278	උදලු 01යි
19.	63265	දිග කියත් 01යි
20.	63265	බන්ඩ් කියත් 01යි
		පොරව 01යි
	63265	හුළං පොම්ප 01යි
21.	39112	පොරව 01යි
22.	39113	කුඩා යතු කැට 01යි
	39113	නියන් 01යි
	39113	අත් කියත් 01යි
	39313	මුලු මට්ටම් 01යි
	39313	කරාම 01යි
23.	62188	ග්‍රයින්ඩර් 01යි
	62188	අත් කියත් 01යි
	62188	නියන් 01යි
	62188	වරන්කල 01යි
	62188	මුලු මට්ටම් 01යි
	62188	දිග අත් යතු 01යි
24.	32481	යතු කැට 02යි
	32482	අත කොලු 03යි
	32483	වරන්කල 02යි
		නියන් 03යි
25.	78339	උදලු 01යි
		පිකස් 01යි
		කටු 01යි
26.	78339	කුළු ගෙඩි 01යි
		අලවංගු 01යි
27.	78339	වෙන්ට් රෙදි 01යි
		කඹ 01යි
28.	78339	කුඩා ජෝගු 02යි
		ප්ලාස්ටික් පිඟන් 03යි
		ප්ලාස්ටික් දීසි 02යි
		තාච්චි 03යි
		නෑඹිලි 01යි
		මුට්ටි 02යි
		බෝතල් 01යි
		හැඳි 01යි
29.	ඒ 335/08	ඩීසල් 30 L අඩංගු බූලි 01යි
30.	ඒ 335/08	ඩීසල් 25 L අඩංගු බූලි 01යි
31.	අංක රහිත	හිස් බූලි 05යි
32.	අංක රහිත	හිස් බූලි 05යි
33.	අංක රහිත	හිස් බූලි 05යි
34.	අංක රහිත	හිස් පොඩි බූලි 10යි
35.	අංක රහිත	හිස් පොඩි බූලි 10යි
36.	අංක රහිත	හිස් පොඩි බූලි 10යි
37.	අංක රහිත	පොඩි බැරල් 02යි හිස් බූලි 02යි
38.	අංක රහිත	හිස් බෝතල් 250යි
39.	අංක රහිත	හිස් බෝතල් 250යි
40.	අංක රහිත	හිස් බෝතල් 250යි
41.	අංක රහිත	අබලන් යතුරුපැදි 01යි
42.	අංක රහිත	අබලන් යතුරුපැදි 01යි
43.	11662	හොන්ඩා වර්ගයේ අබලන් යතුරු පැදි 01යි
44.	59993	ස්පෝට් මාදිලියේ පාපැදි 01යි
45.	ඒ 369/08	අංක 201-0032 බජාජ් වර්ගයේ ත්‍රිරෝද රථය
46.	66639	බහු කාර්ය වඩු මැෂින් 01යි
47.	බී 2700/05	රවුම් කියත් තලය සහිත ඉරුම් බංකු 01යි
48.	63265	අත් කියත් 01යි
49.	බී 14/2004	රවුම් කියත් තලය සහිත ඉරුම් බංකු 01යි
50.	අංක රහිත	ඉරුම් බංකු 01යි
51.	බී 1237/08	ගල් කටු 04යි
52.	බී 1237/08	ගල් කටු 04යි
53.	බී1237/08	ගල් කටු 04යි
54.	බී 1237/08	ගල් කටු 05යි
55.	බී 1237/08	ගල් කටු 07යි
56.	බී 1237/08	කුළු ගෙඩි 01යි, මිටි 01යි
57.	බී 1237/08	කුළු ගෙඩි 01යි, මිටි 01යි
58.	බී 1237/08	බොලොක්ක 01යි
59.	බී 1237/08	කොක්ක සහිත දම්වැල් 01යි
60.	බී 1237/08	අලවංගු 01යි, කටු 01යි
61.	බී 1237/08	නාරාසන එකයි, කටු 01යි
62.	බී 1237/08	බාල්දි 02යි
63.	බී 1237/08	අඩි 66 දිග වයර් සහිත හැන්ඩ් ග්‍රයින්ඩර් 01යි
64.	බී 1237/08	ගයිඩර් තල 02යි, කටර් අඬු 01යි, මල් ස්කුරුප්පු නියන් 01යි
65.	බී 1237/08	ටොමෝයාටා එන්. එල්. 2500 සී. එන්. වර්ගයේ ජෙනරේටර් 01යි
66.	බී 1237/08	සාස්පාන් 02යි
		කොරස් 01යි
		නෑඹිලි 01යි
		අත් හිරමන 01යි
		ප්ලාස්ටික් පිඟන් 05යි, හිස් බූලි 01යි, මන්නා පිහි 01යි
67.	66855	ලී ඉරීමට ගන්නා චෙන්සෝ 01යි
68.	81913	2kg පඩි 01යි
	81914	1kg පඩි 05යි
	81916	500g පඩි 01යි
	81917	200g පඩි 03යි
	81919	
	81920	
	81921	

04-515

තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

මගේ අංකය : ආර්/ආ/04/08/01.

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
රා තැබෑරුම් රේන්ද විකිණීම - 2009/2010 වර්ෂය
2009 ජූලි සිට 2010 ජූනි දක්වා

2009 ජූලි මස 01 දින සිට 2010 ජූනි මස 30 දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරා බදු බලපත්‍රයක් ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත් ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ..... රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2009.05.21 වැනි දින පෙ. ව. 10.00 ට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා 1982.08.20 දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2009.05.21 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ තැබෑරුම් සඳහා නැවත විකිණීම 2009.06.04 දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථෝක්ත *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඒ. එම්. ආර්. ජේ. කේ. ජයසිංහ,(වැ. බ.)
ප්‍රාදේශීය ලේකම්, ආරච්චිකට්ටුව.

උපලේඛනය

කොට්ඨාසය	*ග්‍රාමය*	*තැබෑරුම් අංකය*	*ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව*	*ටෙන්ඩර් තැම්පත් කළ මුදල රු.*
ආනවිලුන්දන්	කරුකුපනේ	10	2009.05.21	250 0
ආනවිලුන්දන්	ආරච්චිකට්ටුව	11	පෙ. ව. 10.00 ට	250 0
ආනවිලුන්දන්	බත්තුලුඔය	12		250 0

04-544

ආණ්ඩුවේ නොවන දැන්වීම්

ඇටර්නි බලය අහෝසි කොට ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

නුගේගොඩ, කොහුවල, මල්වත්ත පාරේ, අංක 11/1 හි පැටිකිරිය ආරච්චිගේ දොන් සරණපාල වන මා විසින් නුගේගොඩ, කොහුවල, මල්වත්ත පාරේ අංක 11/1 හි ජයසූරිය ආරච්චිගේ රෝෂාන් මංගල පෙරේරා යන අය වෙත පවරන ලද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නලින්ද ප්‍රේමවර්ධන මහතා විසින් සහතික කරන ලද, 1999 ජූලි 17 දිනැති අංක 94 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අහෝසි කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත් මින් ඉදිරියට ඉහත නම් සඳහන් ජයසූරිය ආරච්චිගේ රෝෂාන් මංගල පෙරේරා යන අය විසින් ඉහත කී ඇටර්නි බලපත්‍රය ප්‍රකාරව මාගේ නමින් හෝ මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මාගේ කිසිදු වගකීමක් නොමැති බවත් මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

2009 මාර්තු මස 26 වැනි දින, කොළඹ දී ය.

04-518

සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2009.03.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි තම සමාගම් නාමය වෙනස් කළ බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පෙර නාමය : ටෙක් ඩිස්ට්‍රිබියුෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 9020
ලියාපදිංචි ලිපිනය : 16 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01

සමාගමේ නව නාමය : ටෙක් වන් ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ්
බී ඩී ඕ බිස්කොන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 65/2,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

04-522

ප්‍රසිද්ධ දැන්වීම

ඒකාබද්ධ කිරීම

ද ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් පී එල් සී සමාගම් අංක පී. කියු. 133 ද ස්වදේශී හර්බල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අංක පී. වී. 3897

2007 වර්ෂයේ අංක 7 දරන සමාගම් පනතේ (පනත) 242 (3) බී වගන්තිය ප්‍රකාර, පීකිව් 133 දරන සමාගම් අංකය යටතේ සංස්ථාපිත ගත කරන ලදී. 'ද ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් පී එල් සී.' නමැති සමාගම සහ අංක පීවී 3897 සමාගමේ අංකය යටතේ සංස්ථාපිත ගත කරන ලද, 'ද ස්වදේශී හර්බල් (ප්‍රයිවට්) ලිමිටඩ් ' සමාගම එකී පනතේ 242 වගන්තිය ප්‍රකාර එකම අස්තිත්වයක් ලෙස ඒකාබද්ධ කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ කරන ලද සමාගමේ නම 'ද ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් පීඑල්සී' වන අතර මෙකී ඒකාබද්ධ කිරීම වර්ෂ 2009 ක් වූ මැයි මස 29 වැනි දින හෝ සමාගමේ රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් අනුමත කරන දින සිට ක්‍රියාත්මක වනු ඇත.

ඒකාබද්ධ කරන ලද, 'ද ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් පීඑල්සී' සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 01, සර් බාරොන් ජයතිලක මාවතේ, ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්ඩියා ගොඩනැගිල්ලේ, අංක 18-2/1 ඒ හි පිහිටු වනු ලැබේ.

මණ්ඩලයේ නියෝගය පරිදි,
එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-523

2007 අංක 07 දරන සමාගම් පනත

ඩී ඇන්ඩ් එන් ඩිස්ට්‍රිබියුෂන් සොලියුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
පී. වී. 67403

ඉහත සඳහන් සමාගම 2009 මාර්තු විසිහතර වන දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 548 බී, නාවල පාර, රාජගිරිය ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

බිස්නස් ඇන් ඉන්ඩස්ට්‍රියල් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 65/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

04-525

දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) උප වගන්තියේ නියමයන් යටතේ කරනු ලබන සංස්ථාපිත සමාගමේ විස්තර දැන්වීම

සමාගමේ නම : සීමාසහිත ස්නෝමෙන් ගෲප් (පෞද්ගලික)
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 66740
ලියාපදිංචි ප්‍රධාන කාර්යාලයේ ලිපිනය : වැල්ලඹඩය, කහන්දාව, රත්න

(සමාගමේ අධ්‍යක්ෂ චන්දන කුමාර ද සිල්වා සන්දරාදුර මහතා විසින් ප්‍රසිද්ධ කරනු ලැබේ.)

04-532

ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම ලියාපදිංචි කරන ලදි.

සමාගමේ නම : ඔරැක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 67376
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 45 ඒ, කනත්ත පාර, තලපත්පිටිය, නුගේගොඩ.

සමාගම් ලේකම්.

04-533

ඇටර්නි බලය අවලංගු කිරීම

රත්නපුර, වේවැල්වත්ත, කඳුරුගලවත්ත, 'සම්පත්' හි පදිංචි හැඩකන්දේ කිරිබබාලාගේ සිරිසේන වන මගේ ඇටර්නි බලකරු ලෙස රත්නපුර, වේවැල්වත්ත, කඳුරුගලවත්ත 'සම්පත්' හි පදිංචි අලුත්ගේ ජයවතී හෙවත් ජයවතී අළුත්ගේ යන අය පත් කරමින් ප්‍රසිද්ධ නොතාරිස් එච්. පී. තිලකරත්න මහතා සහතික කළ අංක 99 හා 2007.12.19 දින දරන ඇටර්නි බලය මෙයින් අවලංගු කර, ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද බව මෙයින් දැනුම් දෙමි.

ඉහත සඳහන් අය මාගේ ඇටර්නි බලකරු ලෙස මා වෙනුවෙන් කරන කිසිදු, ක්‍රියාවකට මින් ඉදිරියට මම වග නොකියන බවත් ප්‍රකාශ කරමි.

04-543

2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (5) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

කොන්ටිෂිප් ඒජන්සීස් ලිමිටඩ් හි කොටස් හිමියන් විසින් 2009.04.15 දින සම්මත කරන ලද යෝජනාවකට අනුව සීමාසහිත පොදු සමාගමක් වශයෙන් පැවතුන ඉහත සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් බවට පත් කිරීමට ද ස්වකීය සමාගම් නාමය කොන්ටිෂිප් ඒජන්සීස් ප්‍රයිවට් ලිමිටඩ් යනුවෙන් වෙනස් කිරීමට සහ ඉහත වෙනස්කම්වලට අනුකූලව නව ව්‍යවස්ථාවලියක් සම්මත කර ගැනීමට ද ඒකමතිකව තීරණය කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
මැක්ලරන්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-557

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල, ඉහළ හංවැල්ල හි පදිංචි රත්නසිරි රූපසිංහ (ජාතික හැඳුනුම්පත් අංක 533161480 වී) වන මම, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජයන්ත ආර්. දොලවත්ත විසින් වර්ෂ 1991.04.24 වැනි දින ලියා සහතික කළ අංක 78 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් එකී ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ බුත්පිටිය , කිනිගම 'වික්‍රම' හි පදිංචි ඉන්ද්‍රානි පුෂ්පලතා රූපසිංහ (විවාහයට පෙර වික්‍රමආරච්චි) නමැති අයට ලබා දුන් ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ සියලු මහජනතාවටත් අන් සියලු දෙනාත් මෙයින් දැන ගනිත්වා.

එකී ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් ඇටෝනි බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ කිසිදු ගණුදෙනුවක් සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් භාර ගනු නොලබන බව ද සියලු දෙනාම මෙයින් දැන ගනිත්වා.

රත්නසිරි රූපසිංහ.

2009 අප්‍රේල් මස 07 වැනි දින.

04-556

දැන්වීම

2007 ව්‍යාපාර නාම ආඥාපනතේ 07 වැනි වගන්තියේ 9 පරිච්ඡේදයේ (1) කොටසට අනුකූලව පහත දැක්වෙන ව්‍යාපාරය සංස්ථාවක් ලෙස ලියාපදිංචි කළ බව මෙම දැන්වීමෙන් දන්වා සිටිනු ලැබේ.

1. ව්‍යාපාරයේ නම : යුරෝනිපෝන් ප්ලාන්ටේෂන්ස් (පුද්) සමාගම
2. ලියාපදිංචි කළ දිනය : 2009 අප්‍රේල් 02 වැනි දින
3. ව්‍යාපාර අංකය : පීවී 67489
4. ලියාපදිංචි ලිපිනය : අංක 262, ගාලු පාර, තල්පිටිය උතුර, වාද්දූව.

ලේකම්,
එකවින්ටින් ඇන්ඩ් අලයිඩ් සර්විසර්ස් (පුද්.) සමාගම.

2009 අප්‍රේල් මස 02 වැනි දින.

04-589

දැන්වීම

2007 ව්‍යාපාර නාම ආඥාපනතේ 07 වැනි වගන්තියේ 9 පරිච්ඡේදයේ (1) කොටසට අනුකූලව පහත දැක්වෙන ව්‍යාපාරය සංස්ථාවක් ලෙස ලියාපදිංචි කළ බව මෙම දැන්වීමෙන් දන්වා සිටිනු ලැබේ.

1. ව්‍යාපාරයේ නම : සීගල් ග්‍රීන් රිසෝට් (පුද්) සමාගම
2. ලියාපදිංචි කළ දිනය : 2009 අප්‍රේල් 02 වැනි දින
3. ව්‍යාපාර අංකය : පීවී 67500
4. ලියාපදිංචි ලිපිනය : අංක 474/4, ගාලු පාර, කොළඹ 03

ලේකම්,
එකවින්ටින් ඇන්ඩ් අලයිඩ් සර්විසර්ස් (පුද්.) සමාගම.

2009 අප්‍රේල් මස 02 වැනි දින.

04-588

දැන්වීම

2007 ව්‍යාපාර නාම ආඥාපනතේ 07 වැනි වගන්තියේ 9 පරිච්ඡේදයේ (1) කොටසට අනුකූලව පහත දැක්වෙන ව්‍යාපාරය සංස්ථාවක් ලෙස ලියාපදිංචි කළ බව මෙම දැන්වීමෙන් දන්වා සිටිනු ලැබේ.

1. ව්‍යාපාරයේ නම : පලිපාන හයිඩ්‍රොලික් ඉන්ජිනියරිං (පුද්) සමාගම
2. ලියාපදිංචි කළ දිනය : 2009 අප්‍රේල් 02 වැනි දින
3. ව්‍යාපාර අංකය : පීවී 67490
4. ලියාපදිංචි ලිපිනය : 38/1/5, වෑකඩ පාර, මාලපල්ල, හෝමාගම

ලේකම්,
එකවින්ටින් ඇන්ඩ් අලයිඩ් සර්විසර්ස් (පුද්.) සමාගම.

2009 අප්‍රේල් මස 02 වැනි දින.

04-587

දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : සමගි කොන්ක්‍රීට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකයඃ පී. වී. 67395
ලියාපදිංචි දිනයඃ 2009.03.24
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 118, ගාලු පාර, හේනමුල්ල. පානදුර.

සමාගම් ලේකම්වරු,
කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්) සමාගම.

04-553

ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

එක්සත් රාජධානිය, එස්2 3ජීඑස්, හීලි හෙෆීල්ඩ්, උතුරු ආන්ස් පාර, අංක, 149 හි පදිංචි ජයන්ති ඇතුලත්මුදලි සිල්වා වන මා විසින් මොරටුව, අඟුලාන දුම්රිය පාර, 2 වැනි පටුමග, අංක 30/10 දරන තැන පදිංචි පුෂ්පා ශ්‍රීමතී කාරියවසම් යන අය වෙත ප්‍රදානය කරන ලද වර්ෂ 2001 ක්වූ අප්‍රේල් මස 11 වැනි දින මිඩ්ල්සෙක්ස්, එච්ඒ9 7ඒබී, වෙම්බ්ලි හි සොලිසිටර්වරු වන ගුරුසිංහ සහ සමාගම ඉදිරියේ දී අත්සන් කරන ලද ඇටර්නි බලපත්‍රය වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන බවත්, එකී පුෂ්පා ශ්‍රීමතී කාරියවසම් යන අය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මින් ඉදිරියට මා වග නොකියන බවත් ඒ හා සම්බන්ධ කිසිදු වගකීමකට නොබැඳෙන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජයන්ති ඇතුලත්මුදලි සිල්වා.

04-583

වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. -තලවතුගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංකය පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර,ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බලයලත් මානක නලින් හේරත් විසින් 2005 අගෝස්තු මස 17 වැනි දින සාදන ලද අංක 2005/354 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේපත්තු හේවාගම් කෝරළේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ තලවතුගොඩ පිහිටි මිල්ලගහලන්ද සහ ආන්දූරුවානගහකනත්ත ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 23 ඒ දරන

පර්චස් විස්සක් (අ. 0 රූ. 0 ප. 20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ සියළුදේත් සමග වේ.

ත්‍රී මයින්ඩ් ෆූඩ් ප්‍රොසසිංග් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට ද, ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, 2009 මැයි මස 15 වැනි දින පෙ. ව. 11.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.12.05 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2008.12.10 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ විරකේසරි පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2009.04.24 වන දින රජයේ ගැසට් පත්‍රය සහ 2009.04.28 වැනි දින දිවයින සහ ද අයිලන්ඩ් පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම.- තලවතුගොඩ මංසන්දියේ සිට හෝකන්දර පාරේ මීටර් 300 ක් පමණ රුහුණුපුර මාවත දක්වා ගොස් එම පාරේ මීටර් 350 ක් පමණ ගිය විට මෙම දේපළ දකුණු පසින් පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- විකිණීම් ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (01%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ තලවතුගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු යි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, සහ උසාවි කොමසාරිස්, කොළඹ
වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය, බලයලත්
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, රාජ්‍ය සහ වාණිජ බැංකු.
අංක 99, උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන/ෆැක්ස් : 011 2445393.
කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංකඃ 7, සුරම්‍යා ගොඩනැගිල්ල,
කෝට්ටේ පාර,
තලවතුගොඩ.
දුරකථන අංකය : 011 2773152,
ෆැක්ස් අංකය : 011 2773553.

04-592

ඩීඑෆ්සීසී බැංකුව

(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අංක 995 සහ 1718 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිපළාත කෝරළේ, ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වැවගෙදරගම ලුණුවත්තෙහි පිහිටා ඇති ගිණිකටුකැලේ හෙවත් ගිණිකටුගල ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම් කැබලි දෙක මෙසේ සඳහන් කර ඇත.

බලයලත් මිනින්දෝරු අයි. කොටැඹිගේ විසින් සකසන ලද 2005 දෙසැම්බර් මස 28 වැනි දිනැති අංක 965 දරන පිඹුරු පතෙහි ලොට් අංක 1 සහ 2 ලෙස විස්තර කර ඇත.

ඉඩමේ ප්‍රමාණය : ලොට් අංක 1 : අ. 0, රූ. 0, පර්. 28.50,
ලොට් අංක 2 : අ. 0, රූ. 1, පර්. 4.70 එහි පිහිටි සියල්ල සහිතව.

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද 2006 ජනවාරි මස 04 වැනි දින දාතමින් යුතු අංක 995 දරන උකස්කරය සහ 2006 දෙසැම්බර් මස 06 වැනි දින දාතමින් යුතු අංක 1718 දරන උකස්කරය ප්‍රකාර ලුණුවත්ත පදිංචි ආරච්චි පතිරණගේ අසේල ඉන්ද්‍රානන්ද විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී. එෆ්. සී. සී. බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 මැයි මස 14 වැනි (බ්‍රහස්පතින්දා) දින පෙ. ව. 11.00ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීම් ක්‍රමය.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

01. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
02. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
04. රු. 38,500ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
05. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500.00,
06. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී. එෆ්. සී. සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංක : 011-2440366/77

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000 සහතිකය ලත්
ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

ප්‍රධාන කාර්යාලය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 5.
දුරකථන අංක : 011-2502680, 011-2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් : schokman@samera1892.com
වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com

04-590

රුහුණ සංවර්ධන බැංකුව - කැකණදුර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2009.06.03 වැනි දින පෙ. ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, තල්ලේපේ පිහිටි, කොරදුමනියවත්තේ බෙදා වෙන් කළ අංක 01 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු එන්. විජේවීර මහතා විසින් මැන සාදන ලද අංක 4708 හා 1993.10.31 දරන පිඹුරේ බෙදා වෙන් කළ අංක 33 දරන පර්චස් දහයයි දශමය පහක් (අ. 0, රූ. 0, පර්. 10.5)ක් විශාල ඉඩම හා ඒ තුළ පිහිටි සියළු වැවිලි හා ගොඩනැගිලි ද ඉහත කී සැළැස්මේ පාර සඳහා වෙන් කළ බිම් තීරුව පාරක් වශයෙන් පාවිච්චි කිරීමේ අයිතිය ද වේ.

වැඩි විස්තර සඳහා 2008.12.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.02.10 වැනි දින දිනමිණ, තිනකරන් හා දි අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසීම.- තලල්ල උතුර පාසල අසළින් වැටී ඇති ලක්සිරි උයන පාරේ වෙන්දේසි වත්තේ රේල් පාර පසුකර මී. 50ක් ඉදිරියට ගිය පසු වම් පසට ඇති පාරේ 03 වැනි නිවස හා ඉඩම වේ.

ගෙවීම් ක්‍රමය.- වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතු ය :-

01. ගැණුම් මිලෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ, අංක 382ඒ දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යධිකාරිතුමාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209, 041-2264457

ජී. පී. ආනන්ද,
සාම විනිසුරු බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර.

දුරකථන අංක : 041-2228731, 071-4438516

04-520/1

රුහුණ සංවර්ධන බැංකුව - වැලිගම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2009.06.01 වැනි දින පෙ. ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, මිදිගම, විලේගොඩ පිහිටි මාදම්පාවත්ත නමැති ඉඩමේ බෙදා වෙන් කළ අංක 03 දරන කැබැල්ල බලයලත් මිනින්දෝරු එන්. විජේවීර මහතා විසින් මැන සාදන ලද අංක 5536 හා 1997.07.02 දිනැති පිඹුරේ පෙන්වා ඇති අංක 03ඒ දරන පර්චස් තිස් පහක් විශාල ඉඩම හා ඒ පිහිටි සියළු වැවිලි සහ ගොඩනැගිලි ද සමග වේ.

වැඩි විස්තර සඳහා 2009.01.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.02.20 වැනි දින දිනමිණ, තිනකරන් හා ද අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසීම.- වැලිගම, ඉබ්බාවල හරහා ඉමදුව මාර්ගයේ ඉබ්බාවල පාසල් හන්දියෙන් දකුණට ඇති රණමයුරගම, විලේගොඩ සිට කි. මී. 01ක් පමණ දුර යන විට විලේගොඩ මාදම්පාවත්ත නමැති මෙම දේපළ පාරේ වම්පස පිහිටා ඇත.

ගෙවීම් ක්‍රමය.- වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය :-

01. ගැණුම් මිලෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382ඒ දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යධිකාරිතුමාට ගෙවිය යුතු ය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209, 041-2250166.

ජී. පී. ආනන්ද,
සාමවිනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර.

දුරකථන අංක : 041-2228731
071-4438516

04-520/2

ලංකා බැංකුව

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.02.27 වැනි දිනැති අංක 1591 දරන *ගැසට් පත්‍රයේ* හා 2009.02.19 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දීම 2009.05.23 වැනි දින පෙ. ව. 11.30ට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් හි පදිංචි වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ (මාකොළ උප කාර්යාලය) ගෝනවල පිහිටි, කොස්කුඹුර පාරේ, වරිපනම් අංක 40/15 දරන ගොරකගහවත්ත නොහොත් දෙල්ගහවත්ත දෙල්ගහකනත්ත, කොස්කුඹුරේ පිල්ලෑව, කොස්කුඹුරේ ඕවිට, කොස්කුඹුරේ මඩකකාර සහ මඩකකාර දැනට කොස්කුඹුරේ වත්ත යනුවෙන් ප්‍රසිද්ධ ඉඩම බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ඩී. එස්. ද සිල්වා විසින් සාදන ලද 1996 අප්‍රේල් මස 26 දිනැති අංක 3264/B දරන පිඹුරෙහි ලොට් 6 ලෙස සටහන් කර විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල වන එකී ලොට් 6, උතුරට : ඇල සහ වික්‍රමරත්නට සහ වෙනත් අයට අයත් කුඹුර ද, නැගෙනහිරට : ලොට් 7 ද, දකුණට : ලොට් ආර්3 ද, බස්නාහිරට : ලොට් 5 ද, මායිම්ව පර්චස් පහළොවක (අ. 0, රූ. 0, පර්. 15) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි හතයි නවයයි හතරක (හෙක්ටයාර් 0.03794) වපසරියකින් යුක්ත වන අතර එකී අංක 3264/B දරන පිඹුර ප්‍රකාර එහි ඇති සියලු දේ ද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C504/277හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී පරිදි ගෝනවල පිහිටි කොස්කුඹුර පාරේ, වරිපනම් අංක 40/15 දරන 'ගොරකගහවත්ත' නොහොත් දෙල්ගහවත්ත, දෙල්ගහකනත්ත, කොස්කුඹුරේ පිල්ලෑව, කොස්කුඹුරේ ඕවිට, කොස්කුඹුරේ මඩකකාර සහ මඩකකාර දැනට 'කොස්කුඹුරවත්ත' යනුවෙන් ප්‍රසිද්ධ ඉඩම ඉහත කී අංක 3264/බී දරන පිඹුරෙහි ලොට් 7 ලෙස සටහන් කොට දක්වා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල වන එකී ලොට් 7, උතුරට : වික්‍රමරත්නට සහ වෙනත් අයට අයිති කුඹුර ද, නැගෙනහිරට : ලොට් 8 ද, දකුණට : ලොට් R 3 ද, බස්නාහිරට : ලොට් 6 ද මායිම්ව පර්චස් පහළොවක (අ. 0, රූ. 0, පර්. 15) නැතහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි හතයි නවයයි හතරක (හෙක්ටයාර් 0.03794) වපසරියකින් යුක්ත වන අතර එකී අංක 3264/බී දරන පිඹුර ප්‍රකාර එහි ඇති අනෙක් සියළු දේ ද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 504/278හි ලියාපදිංචි කර ඇත.

ඒ සමගම එයට දක්වා ඇති පාරේ අයිතිය ද ඇති අතර එනම්, ඉහත කී අංක 3264බී දරන ලොට් ආර් 3 ලෙස සටහන් කර ඇති (අඩි 15ක් පළල පාරට වෙන්කළ කොටස) බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. එස්. ද සිල්වා විසින් සාදන ලද අංක 3264A දරන පිඹුරෙහි ලොට් 2 (අඩි 10ක් සහ 15ක් පළල පාර) බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. එස්. ද සිල්වා විසින් සාදන ලද අංක 1441 දරන පිඹුරෙහි ලොට් 2 (අඩි 10ක් පළල පාරට වෙන්කළ කොටස) සහ බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. එස්. ද සිල්වා විසින් සාදන ලද අංක 1781 දරන පිඹුරෙහි ලොට් 7 (පාරට වෙන්කළ කොටස) ද වේ.

පී. පී. ජේ. වීරසිංහ,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
ග්‍රෑන්ඩ්පාස් ශාඛාව.

04-584

රුහුණ සංවර්ධන බැංකුව - තංගල්ල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2009.06.08 වැනි දින පෙ. ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවාපත්තුවේ, තංගල්ල නගර සීමාව තුළ මැදකැටිය කොට්ඨාසයේ දීපංකර පාරේ පිහිටි මහහේන නමැති ඉඩම බෙදාවෙන් කළ අංක 03 දරන කැබැල්ලෙන් බලයලත් මිනින්දෝරු හේමසිරි සිරිවර්ධන මහතා විසින් නැවත බෙදා වෙන් කළ අංක 1019 හා 1997.07.15 පිඹුරේ ප්‍රකාර අංක 04 දරන පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම සහ එහි පිහිටි සියළු වැවිලි සහ ගොඩනැගිලි ද සමග වේ.

ඉහත කී මැදකැටියේ පිහිටි මහහේන නමැති ඉඩම බෙදා වෙන් කළ ඉහත කී අංක 1019 පිඹුරේ දැක්වෙන ලොට් අංක 06 දරන පර්චස් නවයයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 9.4) විශාල බිම් තීරය පාරක් වශයෙන් පාවිච්චි කිරීමේ අයිතිය ද වේ.

වැඩි විස්තර සඳහා 2008.12.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.02.18 වැනි දින දිනමිණ, තිනකරන් හා දි අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසීම.- තංගල්ල තිස්ස පාරේ, මීටර් 850ක් ගියවිට මැදකැටිය පාර හමුවේ. එම පාරේ මී. 150ක් පමණ ගියවිට සුරැකුම් දේපළ හමුවේ.

ගෙවීම් ක්‍රමය.- වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය :-

01. ගැණුම් මිලෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ, අංක 382ඒ දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යධිකාරිතුමාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209 සහ 047-2240631

ජී. පී. ආනන්ද,
සාම විනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර.

දුරකථන අංකය : 041-2228731.

04-529/1

රුහුණ සංවර්ධන බැංකුව - තංගල්ල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2009.06.04 වැනි දින පෙ. ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, කුඩාවැල්ලේ පිහිටි මහවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එල්. සේරසිංහ මහතා විසින් මැන සාදන ලද අංක 08ඒ හා 1996.08.21 දිනැති පිඹුරේ පෙන්වා ඇති ලොට් 1ඒ දරන පර්චස් විසිහතයි දශම හයයි හයක් (අ. 0 රූ. 0 පර්. 27.66) විශාල ඉඩම සහ එහි පිහිටි සියළු වැවිලි සහ ගොඩනැගිලි ද සමග වේ.

වැඩි විස්තර සඳහා 2008.12.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.02.18 වැනි දින දිනමිණ, තිනකරන් හා ද අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසීම.- කුඩාවැල්ල හන්දියේ සිට හුම්මාන පාරේ යනවිට හමුවන 03 වන බෝකොටුව අසල (ලංකා බැංකුවට ඉදිරිපිට) සුරැකුම් දේපළ පිහිටා ඇත.

ගෙවීම් ක්‍රමය.- වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය :-

01. ගැණුම් මිලෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ, අංක 382ඒ දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යධිකාරිතුමාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209, 047-2240631

ජී. පී. ආනන්ද,
සාම විනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර.

දුරකථන අංකය : 041-2228731.

04-529/2

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

CH/O/1A/394.

1980 අංක 56, 1977 අංක 09, 1976 අංක 18, 1974 අංක 34, දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ (සංශෝධිත) නීතියෙන් සංශෝධිත 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිමය නීතිය

17අ(1) වගන්තිය යටතේ නියෝගයයි

ඉහත කී පරිදි සංශෝධනය කරන ලද 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිමය නීතියේ 17අ (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජාතික නිවාස කොමසාරිස් තැන්පත් ලූකස් ඉඳුරුගල්ල වන මම ගරු නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගේ ලිඛිත අනුමැතිය ඇතිව මේ සමග ඇති උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇති බිම් කොටසේ අයිතිය මින් අවසතු කරන අතර එම බිම් කොටස කිසි කලෙකත් මා වෙත පැවරී නොතිබුණු බවට සලකන බවද තවදුරටත් ප්‍රකාශ කරමි.

ලූකස් ඉඳුරුගල්ල,
ජාතික නිවාස කොමසාරිස්.

2009 මාර්තු මස,
නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

උපලේඛනය

බලයලත් මිනින්දෝරු කේ. ත්‍යාගරාජා මහතා විසින් මැන සාදන ලද අංක 848/CH/O/1A/394 හා 1984.08.03 වැනි දින දරන මානක සැලැස්මේ ලොට් අංක 1, 2, 3 සඳහා පර්චස් 18.45 බිම් ප්‍රමාණය සහ ලොට් අංක 8 සඳහා පර්චස් 3.39 බිම් ප්‍රමාණය.

04-546

විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1056 5007 4153.

2007 නොවැම්බර් මස 27 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහියංගන, අරාවත්ත, අංක 9/104හි පදිංචි හේරත් මුදියන්සේලාගේ මුදියන්සේ සේනානායක වේවැල්මඩ සහ විස්සුන්දර මුදියන්සේලාගේ සුනේත්‍රා කුමාරිහාමි යන දෙදෙනා බන්ධනදායන් වශයෙන් සහ ඉහත කී මහියංගන, ආරාවත්ත, අංක 9/104හි හේරත් මුදියන්සෙලාගේ මුදියන්සේ සේනානායක වේවැල්මඩ යන අය උකස්කරු වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2006 ජනවාරි මස 10

දාතම හා අංක 1269 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ඔවුන් වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 අප්‍රේල් මස 17 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙලක්ෂ විසිඑක් දහස් අටසිය අනූ හයකුත් ශත හතලිස් හයක (රු. 2,21,896.46ක් පමණයි) මුදලක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් දෙලක්ෂ විසිඑක් දහස් අටසිය අනූ හයකුත් ශත හතලිස් හයක (රු. 2,21,896.46ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දෙලක්ෂ එක් දහස් තුන්සිය පනහක (රු. 2,01,350ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහසයයි දශම පහ (16.5%) බැගින් 2007 අප්‍රේල් මස 18 වැනි දින සිට එකී අංක 1269 බැඳුම්කරය මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ ණය පියවා නිම වන දින තෙක් තවදුරටත් පොළී මුදල ද, සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 1269 දරන උකස් බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගැමුණුපුර 2ඒ ග්‍රාමසේවක කොට්ඨාසයේ. බිංතැන්න කෝරළේ, සෙරනාගම පිහිටි "සෙරනගමයාය" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සන්ගරන්දෙණිය විසින් සාදන ලද 2005 සැප්තැම්බර් මස 25 දාතම හා අංක 5357 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට : ටො පො පී. පී. 57හි ලොට් 1950 සහ ලොට් 1951 ද, නැගෙනහිරට : ටො පො පී. පී. 57හි ලොට් 1950 සහ ලොට් 1955 1/2 ද, දකුණට : ටො පො පී. පී. 57හි ලොට් 1960 සහ 1962 ද සහ බටහිරට : ටො පො පී. පී. 57හි ලොට් 1953 සහ 1952 ද මායිම් වන ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් විසිදෙකක් වන (අ. 1, රූ. 0, පර්. 22) වන සම්පූර්ණ ඉඩම එහි වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග සහ එයට අදාල සියලුම අයිතීන් මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමග

එකී ලොට් 1 පහත වඩාත් මැනැවින් විස්තර කොට ඇති ඉඩමේ ප්‍රති මිනුමකි.

ඉහත කී බිංතැන්න කෝරළේ, සෙරනගම පිහිටි "සෙරනගමයාය" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. සුබ්‍රමානියම් විසින් සාදන ලද 1986 ඔක්තෝබර් මස 2 දාතම හා අංක 57 දරන ටො පො පී. පිඹුරේ ලොට් 1954 ලෙස ලකුණු කොට දක්වා ඇති බදුල්ල ඉඩම් ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍ර්‍රැව එල්. ඩී. ඕ. ආර්. ඩී. 04/65හි ලියාපදිංචි කොට ඇති එකී අංක 1954 පිඹුරට අනුව උතුරට : ලොට් 1950, 1951 සහ 1952 ද, නැගෙනහිරට : ලොට් 1950 සහ 1955 1/2 ද, දකුණට : ලොට් 1960 සහ 1962 ද සහ බටහිරට : ලොට් 1953 සහ 1952 ද මායිම් වන ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් විසිදෙකක් වන (අ. 1, රූ. 0, පර්. 22) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

04-554/1

කොමර්ෂල් බෑන්ක් ඔf්ප් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔf්ප් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩල විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1630032501, 242264.

2008 දෙසැම්බර් මස 22 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

අම්බලන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද්දාවූ ද, කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී) හි නමට ලියන ලද්දාවූ ද, 2005 ජූනි මස 02 වැනි දින හා අංක 7703 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රත්න සෝ මිල්ස් යන නාම විලාශය යටතේ ඒක පුද්ගල වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පල්ලෙගේ නාමල් කුලරත්න ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ තිස් දහස් නවසිය හැට පහයි ශත පනස් අටක (රු. 5,30,965.58) මුදලක් 2008 සැප්තැම්බර් මස 25 වැනි දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පන්ලක්ෂ තිස්දහස් නවසිය හැට පහයි ශත පනස් අටක (රු. 5,30,965.58) මුදලට 2008 සැප්තැම්බර් මස 26 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු .4,44,000ක මුදල මත 26%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 7703 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝප් වීදියේ, අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංක මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

ඉහත කී උපලේඛනය

බලයලත් මානක ඊ. එම්. පේමසිරි විසින් 1992 දෙසැම්බර් මස 23 වැනි දින සාදන ලද අංක 92/156ඒ දරන පිඹුර පරිදි දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කන්දබඩ පත්තුවේ, නරවල්පිට පිහිටි ඉදිගහවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, වගාවන් සහ සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉදිගහහේන, බබාගෙවත්ත සහ ඉදිගහහේන මහකොස්ගහ වත්ත ද, නැගෙනහිරට : අංක 197ඒ දරන පිඹුරේ ලොට් 2 සහ 3 සහ ගම්සභා පාර ද, දකුණට : අංක 197ඒ දරන පිඹුරේ ලොට් 4 සහ මාරගහවත්ත ද, බස්නාහිරට : කෝන්ගහවත්ත ද යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් දාහතරයි දශම පහක් (අ. 0, රූ. 3, පර්. 14.5) විශාල ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 391/7 යටතේ ලියාපදිංචිව ඇත.

එකී ඉඩම් කොටස පහත විස්තර කරන ලද ඉඩමේ නැවත බෙදීමක් වේ.

බලයලත් මානක එම්. ඒ. එස්. ප්‍රේමරත්න විසින් 1975 ජූනි මස 09 වැනි දින සහ 1975හි ජූනි මස 10 වැනි දින සාදන ලද අංක 197ඒ දරන පිඹුර පරිදි එකී නරවැල්පිටි පිහිටි ඉදිගහවත්ත ඉඩමේ ගොඩනැගිලි, වගාවන් සහ සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉදිගහහේන බබාගේවත්ත සහ ඉදිගහහේන මහකොස්ගහවත්ත ද, නැගෙනහිරට : එම ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 2 සහ 3 සහ පාර ද, දකුණට : මාරගහවත්ත සහ එම ඉඩමේ නැවත බෙදූ ලොට් 4 ද, බස්නාහිරට : එම ඉඩමේ බෙදන ලද ලොට් 4 සහ කොන්ගහවත්ත ද, යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් දාහතරයි දශම පහක් (අ. 0, රූ. 3, පර්. 14.5) විශාල ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 391/7 යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,

සමාගම් ලේකම්.

04-594

කොමර්ෂල් බෑන්ක් ඔf්ප් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔf්ප් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩල විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 315457.

2008 දෙසැම්බර් මස 02 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් 2006 අගෝස්තු මස 15 වැනි දින සහතික කරන ලද අංක 2458 කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී) හි නමට ලියන ලද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඉලන්දාරිදේව නන්දාවතී හෙවත් ඉලන්දාරිදේව ටියුලින් හෙවත් නන්දා ඉද්දමල්දෙනිය ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එකොලොස් ලක්ෂ හැටහතර දහස් හැට දෙකයි ශත හැට අටක (රු. 11,64,062.68) මුදලක් 2008 සැප්තැම්බර් මස 01 වැනි දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එකොලොස් ලක්ෂ හැටහතර දහස් හැට දෙකයි ශත හැට අටක (රු. 11,64,062.68) මුදලට 2008 සැප්තැම්බර් මස 02 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 9,81,360.08 මුදල මත 15.5%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 2458 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝප් වීදියේ, අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

බලයලත් මානක එෆ්. ගුරුගේ විසින් 1968 නොවැම්බර් මස 27 වැනි දින සාදන ලද අංක 142 දරන පිඹුරු පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව, කරන්දෙනිය පිහිටි කීනගහතොට ගොඩැල්ල උඩ මාස්මෝරුගහ වත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් ඒ6 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් ඒ7 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් ඒ8 ද, දකුණට අම්බලන්ගොඩ-ඇල්පිටිය මහා මාර්ගය ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් ඒ5 ද යන මායිම් තුළ එකී අංක 142 දරන පිඹුර පරිදි පර්චස් විසිදෙකයි දශම හතයි හතරක් (අ. 0. රූ. 0, පර්. 22.74) විශාල ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ67/147 යටතේ සහ ඒ62/147 හරස් නිර්දේශය අනුව සහ ඒ 53/178 යටතේ ලියාපදිංචිව ඇත.

මෙම ඉඩම බලපිටිය දිසා අධිකරණයේ අංක එන්පී/1514 දරන නඩුවේ ලේඛණගතවී ඇත.

මෑතක දී සිදුකරන ලද මිණුම් පිඹුර පරිදි එම ඉඩම මෙසේ විස්තර කර ඇත.

බලයලත් මානක ටී, බර්ටි ඒ. සිල්වා විසින් 2006 මැයි මස 05 වැනි දින සාදන ලද අංක 2006/25 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව, කරන්දෙනිය ප්‍රාදේශීය සභා සීමාව තුළ කරන්දෙනිය පිහිටි කිනගහතොට ගොඩැල්ල හෙවත් මාස්මෝරුගහවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් ඒ6 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් ඒ7 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් ඒ8 ද, දකුණට : අම්බලන්ගොඩ-ඇල්පිටිය මහා මාර්ගය ද, බස්නාහිරට : එම ඉඩමේම ලොට් ඒ4 ද යන මායිම් තුළ එකී අංක 2005/25 දරන පිඹුර පරිදි පර්චස් විස්සයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 20.6) විශාල ඉඩම.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,

සමාගම් ලේකම්.

04-595

කොමර්ෂල් බෑන්ක් ඔf්ප් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔf්ප් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩල විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1970007218.

ණය ගිණුම් අංකය : 289628 සහ 348118.

2008 දෙසැම්බර් මස 2 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

අම්බලන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඕ. ඒ. ද සිල්වා විසින් 2006 මාර්තු මස 29 වැනි දින සහතික කරන ලද අංක 1544 සහ 2007 පෙබරවාරි මස 04 වැනි දින සහතික කරන ලද අංක 1659 දරන කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.) හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හෙන්දහේවා සිරිල් හේමචන්ද්‍ර සහ ආෂා මරක්කල නිලූෂා නිලන්ගනී ණයකරුවන්/උකස්කරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කර යටතේ රුපියල් තිස්පන් ලක්ෂ දහසය දහස් හයසිය හැටතුනයි ශත අසූ හයක (රු. 35,16,663.86) මුදලක් 2008 අගෝස්තු මස 26 වැනි දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් තිස්පන් ලක්ෂ දහසය දහස් හයසිය හැටතුනයි ශත අසූහයක (රු. 35,16,663.86) මුදලට 2008 අගෝස්තු මස 27 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 27,34,288.91ක මුදල මත 15%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, සහ රු. 4,81,176.76ක මුදල මත 17%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 1544 සහ 1659 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝප් වීදියේ, අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංක මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

1. බලයලත් මානක පී. ඒ. ආර්. චන්ද්‍රසිරි විසින් 1994 ජූනි මස 18 වැනි දින සාදන ලද අංක 1784 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, අම්බලන්ගොඩ, හිරේවත්ත පිහිටි රුක්අත්තනගහ වත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 1බී1 කියන ඉඩමට මායිම්, උතුරට : ලිඳමුලවත්ත ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 2බී ද, දකුණට : එම ඉඩමේ ලොට් 1බී2 ද, බස්නාහිරට : නගර සභා පාර ද යන මායිම් තුළ පර්චස් හතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 4.5) විශාල ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 264/166 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

2. බලයලත් මානක පී. ඒ. ආර්. චන්ද්‍රසිරි විසින් 1994 ජූනි මස 18 වැනි දින සාදන ලද අංක 1784 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, අම්බලන්ගොඩ, හිරේවත්ත පිහිටි රුක්අත්තනගහ වත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 1බී2 ලෙස ලකුණු කරන ලද ඉඩමට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 1බී1 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 2බී ද, දකුණට : එම ඉඩමේ ලොට් 12බී ද, බස්නාහිරට : නගර සභා පාර ද, යන මායිම් තුළ පර්චස් හතරයි දශම පහක් (අ. 0, රූ. 0. පර්. 4.5) විශාල ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 264/167 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,

සමාගම් ලේකම්.

04-593

සෙලාන් බැංකුව පී.එල්.සී. - අම්බලන්ගොඩ ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.01.27 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0240-01360233-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ආතුලා ප්‍රියදර්ශනී පලිහපිටිය විසින් සහතික කරන ලද 2006 මාර්තු මස 02 දිනැති අංක 55 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම මීටියාගොඩ පදිංචි ගොඩගම ගමගේ උපාලි සහ ගොඩගම ගමගේ ඥාණතිලක යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දසලක්ෂ විසිදහස් හත්සිය තිස් අටයි ශත අනූහතක (රු. 10,20,738.97) මුදලක්, 2007 නොවැම්බර් මස 13 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 10,20,738.97 මුදල ද, 2007 නොවැම්බර් මස 14 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 55 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුව තුළ අළුත්වල මහගම්ගොඩ පිහිටි පීපී.10927හි පෙන්නුම් කරනු ලබන දෙහිගහබැද්ද නමැති ගස්, වගා, ගොඩනැගිල්ල සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1හි ලොට් ඒ සහ බී දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස්වලට මායිම්, උතුරට : පීපීඒ 583හි දැක්වෙන ලොට් 9 සහ පීපීඒ 583හි දැක්වෙන ලොට් 10 ද, නැගෙනහිරට : පීපී 10927හි දැක්වෙන ලොට් 2 සහ පාර ද, දකුණට : පීපීඒ 583හි දැක්වෙන ලොට් 10 සහ 11 සහ බස්නාහිරට : පීපීඒ 583හි දැක්වෙන ලොට් 8 සහ 9 යන මායිම් තුළ බලයලත් මිනින්දෝරු සී. ටී. ද එස්. මනුකුලසූරිය විසින් සාදන ලද 1995.06.22 දිනැති අංක 1118 දරන සැලැස්ම අනුව රූඩ් තුනයි, පර්චස් තිස් පහක් (අ. 0, රූ. 3, පර්. 35) විශාල ඉඩම. මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍ර්‍රැව සී 815/112හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

04-552/2

සෙලාන් බැංකුව පී.එල්.සී. - මඩකලපුව ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.01.27 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0730-02229020-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී) ප්‍රසිද්ධ නොතාරිස් එන්. වේලුපිල්ලෙයි විසින් සහතික කරන ලද 2006 ඔක්තෝබර් මස 31 දිනැති අංක 520 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මඩකලපුව පදිංචි සේගු ලෙබ්බේ මොහමඩ් නිසාර් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිනව ලක්ෂ අසූදෙදහස් තුන්සිය විසිතුනයි ශත පනස් දෙකක (රු. 29,82,323.52) මුදලක්, 2008 ජනවාරි මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 29,82,323.52 මුදල ද, 2008 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් හය (36%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 520 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලෙයි පත්තුවේ, මීරවෝදෙයි පිහිටි ප්‍රමාණයෙන් උතුරේ සිට දකුණට : බඹ දහ අටක් (18) සහ නැගෙනහිරට සහ බස්නාහිරට : බඹ දහ තුනක් (13) විශාල ඔලුන්කෙයි වලවු නමැති නිවස, ළිඳ සහ එහි තුළ අඩංගු වෙනත් සියලු අයිතීන් සමග බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : චරිපු ලෙච්චායි පවුච්යාගේ ඉඩම ද, දකුණට : පාර ද, නැගෙනහිරට : පටු මග සහ බස්නාහිරට : මසාහිරාගේ වත්ත ද වේ.

බලයලත් මිනින්දෝරු එස්. නාගලිංගම් විසින් සාදන ලද 2006.02.02 දිනැති අංක එස්එන්/06/6451 දරන සැලැස්ම අනුව ඉහත සඳහන් උපලේඛනය පහත සඳහන් පරිදි විස්තර කර ඇත :

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලෙයි පත්තු බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ඔඩ්ඩමවාඩි ප්‍රාදේශීය සභා සීමාව තුළ වෝඩ් අංක 04 වීරවෝදෙයි ගමේ පාසල් පාර පිහිටි වරිපනම් අංක 120 දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එස්. පෝසියාගේ ඉඩම ද, නැගෙනහිරට : පටුමග ද, දකුණට : පාසල් පාර ද සහ බස්නාහිරට : මසාහිරාගේ වත්ත ද යන මායිම් තුළ පර්චස් විසි අටයි දශම හතරයි හතක් (අ. 0, රූ. 0, පර්. 28.47) නොහොත් හෙක්ටයාර් 0.0720 විශාල සියලු හිමිකම් සහ එහි තුළ අඩංගු සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

04-552/3

ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද අංක 1776 හා 2007 ජනවාරි මස 09 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම (මෙහි මින් ඉදිරියට "ණය ගැණුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) බිබිලේ, රත්නවීර ආරච්චිගේ ප්‍රසාද් ඉන්දික වීරසිංහ නොහොත් රත්නවීර ආරච්චිලාගේ ප්‍රසාද් ඉන්දික වීරසිංහ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ජනවාරි මස 31 වැනි දිනට ඉහත කී අංක 1776 දරන උකස් බැඳුම්කරය මත එකී රත්නවීර ආරච්චිගේ ප්‍රසාද් ඉන්දික වීරසිංහ නොහොත් රත්නවීර ආරච්චිලාගේ ප්‍රසාද් ඉන්දික වීරසිංහගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දහතුන් ලක්ෂ නවදහස් තුන්සිය විසිපහකුත් ශත අනූ අටක (රු. 13,09,325.98) මුදලක් සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එකොළොස් ලක්ෂ තිස් හත් දහස් අටසිය හතලිස් අටක් (රු. 11,37,848) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි මස 01, අප්‍රේල් මස 01, ජූලි මස 01 සහ ඔක්තෝබර් මස 01 යන මාසවල දී වැඩ කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දහතුන් ලක්ෂ නවදහස් තුන්සිය විසිපහකුත් ශත අනූ අටක (රු. 13,09,325.98) මුදලක් සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එකලොස් ලක්ෂ තිස් හත් දහස් අටසිය හතලිස් අටක් (රු. 11,37,848) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල දී වැඩ කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1776 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 1776 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැගම්පත්තු කෝරළේ, බිබිලේ පිහිටි "වැව පිටලන්ද" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඉරන්දතිස්ස කොටඹගේ විසින් මැන සාදන ලද අංක මො/3080 හා 2002.06.01 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කළ (FVP 573 පිඹුරේ ලොට් අංක 123හි කොටසක් වන) බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : මෙම ඉඩමේ කොටසක් ද, නැගෙනහිරට : මහ පාර (මේන් රෝඩ්) ද, දකුණට : බලයලත් මිනින්දෝරු එච්. එම්. සමරනායක විසින් මැන සාදන ලද අංක 2205 දරන පිඹුරේ ලොට් අංක 1 සහ 2 ද, බස්නාහිරට : මෙම ඉඩමේ කොටසක් ද යන මායිම් ඇතුළත පර්චස් විසිනවයකුත් දශම බිංදුවයි හතක් (අ. 0. රූ. 0, පර්. 29.07) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.
04-572/1

ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද අංක 616 හා 2005 ජූනි මස 28 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "ප්‍රින්ස් මෝටර්ස්" යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාරය කරගෙන යන බෙමුණුසිංහ ආරච්චිගේ ප්‍රියන්ත දේශප්‍රිය බණ්ඩාර සහ ජයවීර ජයරත්න පටබැඳිගේ සුසිල් ජයරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ජනවාරි මස 31 වැනි දිනට ඉහත කී අංක 616 දරන උකස් බැඳුම්කරය මත එකී බෙමුණුසිංහ ආරච්චිගේ ප්‍රියන්ත දේශප්‍රිය බණ්ඩාර සහ ජයරත්න පටබැඳිගේ සුසිල් ජයරත්න යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එකොළොස් ලක්ෂ හතලිස් අට දහස් දෙසිය හැටනවයකුත් ශත හතලිස් හතක (රු. 11,48,269.47) මුදලක් සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හත්ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය විසි නවයක් (රු. 7,33,329) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි මස 1, අප්‍රේල් මස 1, ජූලි මස 1 සහ ඔක්තෝබර් මස 1 යන දිනවල දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහල අනුපාතිකයක් මත ගණන බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එකොළොස් ලක්ෂ හතලිස් අට දහස් දෙසිය හැටනවයකුත් ශත හතලිස් හතක (රු. 11,48,269.47) මුදල සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හත්ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය විසි නවයක් (රු. 7,33,329) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි මස 01, අප්‍රේල් මස 01, ජූලි මස 01 සහ ඔක්තෝබර් මස 01 යන දින වල දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 616 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ගාමිණි දියාව මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 616 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුත්තල කෝරළේ, පෙත්තගම්වෙල පිහිටි "කඳුරුගස්අරාවෙ හේන" නමැති ඉඩමේ මැනුම් අධිකාරිවරයා විසින් මැන සාදන ලද අංක මො/බීටීටී/93/18 දරන පිඹුරේ ලොට් අංක 44 ලෙස දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : පාරේ රිසවේසම ද, නැගෙනහිරට : ආර්. එස්. පී. රාජපක්ෂට සහ ඩබ්ලිව් ඒ. රණසිංහට අයිති ඉඩම් ද, දකුණට : ඒ. ජී. විජේපාලට අයිති ඉඩම ද, බස්නාහිරට : ඩී. එම්. කිරිබණ්ඩාට සහ ඩී. එම්. ධනපාලට අයිති ඉඩම් ද යන මායිම් ඇතුළත පිහිටි හෙක්ටයාර් දශම අටයි එකයි බිංදුවක (හෙ. 0.810) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.
04-572/2

ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ :

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද අංක 1629 හා 2006 නොවැම්බර් මස 02 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ග්‍රීන් වැලි බියර් රෙස්ටෝරන්ට් යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන හොප්ටන්හි, රත්නායක මුදියන්සේලාගේ නිමල් සෙනෙවිරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ජනවාරි මස 31 වැනි දිනට ඉහත කී අංක 1629 දරන උකස් බැඳුම්කරය මත එකී රත්නායක මුදියන්සේලාගේ නිමල් සෙනෙවිරත්න යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දසලක්ෂ හැට එක් දහස් හත්සිය පනස් නවයකුත් ශත අනූහතරක (රු. 10,61,759.94) මුදලක් සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අටලක්ෂ හයදහස් අනූ දෙකක් (රු. 8,06,092) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි මස 01, අප්‍රේල් මස 01, ජූලි මස 01 සහ ඔක්තෝබර් මස 01 යන දිනවල දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දසලක්ෂ හැට එක් දහස් හත්සිය පනස් නවයකුත් ශත අනූහතරක (රු. 10,61,759.94) මුදලක් සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අටලක්ෂ හයදහස් අනූ දෙකක් (රු. 8,06,092) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි මස 01, අප්‍රේල් මස 01, ජූලි මස 01 සහ ඔක්තෝබර් මස 01 යන දිනවල දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලි අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1629 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ගාමිණි දියාව මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 1629 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, (වෙල්ලස්ස) මැදගම් පත්තු කෝරළේ, කර නැම්මේ පිහිටි, "මහකුඹුර හේන" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද අංක 4586 හා 1998.02.21 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 11 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ලොට් අංක 10 සහ ඇල ද, නැගෙනහිරට : ඇල ද, දකුණට : ඇල සහ පාර ද, බස්නාහිරට : පාර ද යන මායිම් ඇතුළත පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලුපාර,
කොළඹ 3
04-572/3

සෙලාන් බැංකුව පීඑල්සී - අම්බලන්ගොඩ ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමු පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0240-0251341-0001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.08.20 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියා පදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් යූ. ජේ. එන්. ජයලත් විසින් සහතික කරන ලද 2005 නොවැම්බර් 28 දිනැති අංක 1103 බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, හික්කඩුව ඩිල්ෂාන් එක්ස්පෝට් මෙම්බර්ස් ඔෆ් ප්ලාන්ටර්ස් ස්පයිස් සිනමන් එක්ස්පෝර්ට් හවුල්කරුවන් වන දිනමුනි සවිත්‍රි වික්‍රමරත්න විවාහයට පෙර මැන්දිස්, දිනේෂා චාමිනී වික්‍රමරත්න, මානික්කුවහන්දි අසේල ලසන් ද සිල්වා සහ මානික්කුවහන්දි චමින්ද ලසන් ද සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑතුන් ලක්ෂ අසූහත් දහස් පන්සිය අනූහතරයි ශත පනහක (රු. 73,87,594.50) මුදලක්, 2007 ඔක්තෝබර් 09 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 73,87,594.50 මුදල ද, 2007 ඔක්තෝබර් 10 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1103 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උගස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

ඉහත සඳහන් උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ වලල්ලාවිට කෝරළේ, බෙන්තොට කොස්ගොඩ අහුන්ගල්ල පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. පී. මැන්දිස් විසින් සාදන ලද 2003.07.05 දිනැති අංක 6055 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෝතගේවත්ත, මල්විබෝවිස්ලාගේ මාවත වත්ත හෙවත් අඹගහ වත්ත, සිපෝනා රිසයිඩඩ් වීරපනික්කිගෙදර වත්ත, වෙද උපකාරගේවත්ත, ලක්මුණිගෙදරවත්ත නමැති යාබද ඉඩමේ ලොට් 6 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 1 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 7 (පාර ද), දකුණට : ලොට් 5 සහ වීරපත්තිනිගෙදර වත්ත, මාවතවත්ත සහ අඹගහවත්ත සහ බස්නාහිරට : ලොට් ඒ1/ඩී යන මායිම් තුළ පර්චස් තිස් එකයි දශම පහයි බිංදුවක් (අ.0, රූ.0, පර්. 31.50) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව බී 471/249 හි ලියාපදිංචි කර ඇත.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ වලල්ලාවිට කෝරළේ බෙන්තොට කොස්ගොඩ අහුන්ගල්ල පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. පී. මැන්දිස් විසින් සාදන ලද 2003.07.05 දිනැති අංක 6055 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෝතගේවත්ත, මල්විබෝවිස්ලාගේ මාවත වත්ත හෙවත් අඹගහවත්ත, සිපෝනා රිසයිඩඩ් වීරපනික්කිගෙදරවත්ත, වෙද උපකාරගේවත්ත, ලක්මුණිගෙදරවත්ත නමැති යාබද ඉඩමේ ලොට් 7 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : රාජපක්ෂ මාවත ද, නැගෙනහිරට : ලොට් 2, 3, 4, සහ 5 ද, දකුණට ලොට් 5 සහ බස්නාහිරට : ලොට් 1, 5 සහ 6 යන මායිම් තුළ පර්චස් නවයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 9.25) විශාල, ඉඩම උඩින් මාර්ග අයිතිය සමඟ.

මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව බී 471/227 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

04-552/1

සෙලාන් බැංකුව පීඑල්සී - යාපනය ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0850-01107956-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 නොවැම්බර් මස 27 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී) ප්‍රසිද්ධ නොතාරිස් එස්. නිශාන්දන් විසින් සහතික කරන ලද 2006 අගෝස්තු මස 30 වැනි දින අංක 437 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, යාපනය ලියාපදිංචි අංක 2002.10.22 දිනැති ජේ/ඩීඑස්/බීආර්/666 දරන පී. ටී. ආර්. ට්‍රේඩර්ස් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ දෙදෙනාම හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන පොන්නදුරෙයි තවරාසා සහ සිවදේවි තවරාසා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි දහහත්ලක්ෂ හතලිස් දහස් තුන්සිය අනූඑකයි ශත අසූහතක (රු. 1,17,40,391.87) මුදලක් 2007 සැප්තැම්බර් මස 30 වැනි දින වන විට, සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 1,17,40,391.87 මුදල ද, 2007 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරිමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 437 බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වඩමාරච්චි කොට්ඨාශයේ, පේදුරුතුඩුව දේවස්ථානයට අයිති බටහිර පුලෝලි වෙන්රිපගුතේවන්කුරවි, සිංගපගුතේවන්කුරිවි සහ මලවරයකුරවි සහ පේදුරුතුඩුව මලවරයකුරිවි පිහිටි පේදුරු තුඩුව බලයලත් මිනින්දෝරු ඒ. වෙල්මුරුගු විසින් සාදන ලද 2006.03.30 දිනැති අංක 2062 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ලෙස පෙන්නුම් කරනු ලබන පික්කලඩ්ඩි, තින්නයික්කලඩ්ඩි, කරනායිඋමායියනොල්ලයි, කොට්ටන්පෙරියන්සීමා, කොම්පයික්කලඩ්ඩි සහ නම්පියනොල්ලායි නමැති ඉඩම් කොටස්වලට මායිම් උතුරට : පටු මග, නාගමුතු කුමාරසාමි භාර්යාව මහේෂ්වරී සහ සිවකුරු සුබ්‍රමනියම් භාර්යාව තිලගරානිගේ දේපළ, නැගෙනහිරට : නාගමුතු කුමාරසාමි භාර්යාව මහේෂ්වරී, සිවකුරු සුබ්‍රමනියම් භාර්යාව තිලගරානිගේ දේපළ සහ වයිරවියාර් සෙනියර් සහ තවත් අයගේ උරුමක්කරුවන් විසින් හිමිකම් කියනු ලබන දේපළ ද, දකුනට : අම්ර්තලිංගම් දියණිය අම්ර්තයෝගම්ගේ දේපළ ද, සිවසුබ්‍රමනියම් භාර්යාව සීතාතේවි දේපළ, පරමගුරු භාර්යාව තනලක්කුමිගේ දේපළ සහ සන්දයියා දේවසිගාමනීගේ දේපළ සහ බස්නාහිරට : නාගමුතු කුමාරසාමි භාර්යාව මහේෂ්වරීගේ දේපළ සහ විනයාග මුදලියාර් පටුමග යන මායිම් තුළ ලාචම් එකොලහයි දෙකයි දශම පහයි බිංදුවයි (11 එල්එම්එස් 2.50 කේඑල්එස්) විශාල ඉඩම. මෙය පේදුරුතුඩුව කොට්ඨාශයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඒ කාණ්ඩය 35 පත්ඉරුව 256 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමන්‍යාධිකාරී-නීති.

04-551/2

ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. එන්. ඒ. කුරේරා විසින් ලියා සහතික කරන ලද අංක 2611 හා 2006 ජූලි මස 20 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "ඒ. එස්. ආර්. සහ සමාගමේ" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාරය කරගෙන යන රමණී නිර්මලා පලිහපිටිය රුදිගු නොහොත් රමණී නිර්මලා, ලලිත් සෝමදේව හෙට්ටිතන්ත්‍රිගේ, බැටියන් කෝරාලලාගේ රුවන් එරංජන් රුදිගු, සහ බැස්ටියන් කෝරාලලාගේ නිරෝෂි තුෂාරිනි රුදිගු යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 2611 දරන උකස් බැඳුම්කරය මත එකී යන රමණී නිර්මලා පලිහපිටිය රුදිගු නොහොත් රමණී නිර්මලා, ලලිත් සෝමදේව හෙට්ටිතන්ත්‍රිගේ, බැටියන් කෝරාලලාගේ රුවන් එරංජන් රුදිගු, සහ බැස්ටියන් කෝරාලලාගේ නිරෝෂි තුෂාරිනි රුදිගු යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එක්කෝටි හැත්තෑහය ලක්ෂ තිස් දෙදහස් දෙසිය හතලිස් එකකුත් ශත පනස් තුනක (රු. 1,76,32,241.53) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක් කෝටි විසිපන් ලක්ෂයක් (රු. 1,25,00,000) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි මස 01, අප්‍රේල් මස 01, ජූලි මස 01 සහ ඔක්තෝබර් මස 01 යන දිනවල දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එක්කෝටි හැත්තෑහය ලක්ෂ තිස් දෙදහස් දෙසිය හතලිස් එකකුත් ශත පනස් තුනක (රු. 1,76,32,241.53) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක් කෝටි විසිපන් ලක්ෂයක් (රු. 1,25,00,000) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි මස 01, අප්‍රේල් මස 01, ජූලි මස 01 සහ ඔක්තෝබර් මස 01 යන දින වලදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ චංචල දේපළ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උසස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2611 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන චංචල දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 2611 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

හඳුනා ගැනීමේ අංකය	වාහන විස්තරය, වර්ගය, මෝස්තරය, අශ්වබලය යනාදිය	චැසි අංකය	එන්ජින් අංකය	නවතා තබන ස්ථානය
Wp JS-7210	ඉසුසු ට්‍රීසර් ට්‍රක්	NPR 71L-7420098	4 GHI 631763	අංක 537, 2 වැනි මහල, මැද කොළඹ සාප්පු සංකීර්ණය, කොළඹ 11
Wp JS-7220	ඉසුසු ට්‍රීසර් ට්‍රක්	NKR 71L-7405960	4 GHI 762367	අංක 537, 2 වැනි මහල, මැද කොළඹ සාප්පු සංකීර්ණය, කොළඹ 11
Wp JS-7264	ඉසුසු KK NPR 75 LYR	NPR 75 LY 7000085	4 HKI 665439	අංක 537, 2 වැනි මහල, මැද කොළඹ සාප්පු සංකීර්ණය, කොළඹ 11
Wp JS-7276	ඉසුසු KK FK 61 FH	FK 61 FH 750101	6 M 60 017346	අංක 537, 2 වැනි මහල, මැද කොළඹ සාප්පු සංකීර්ණය, කොළඹ 11
48-7383	ඉසුසු NPR 58 L	NPR 58 L 7142937	4 BEI 335151	අංක 537, 2 වැනි මහල, මැද කොළඹ සාප්පු සංකීර්ණය, කොළඹ 11

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලුපාර,
කොළඹ 3.
04-572/4

සෙලාන් බැංකුව පීඑල්සී - වවුනියාව ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0720-01606054-001 සහ 0720-01606672-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 ජනවාරි මස 27 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලද) ප්‍රසිද්ධ නොතාරිස් එස්. නිශාන්දන් විසින් සහතික කරන ලද 2007 අප්‍රේල් මස 24 වැනි දින අංක 675 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වවුනියාව, මෙසස් ස්වර්ණා ට්‍රාන්ස්පෝට් සර්විස් හි සෙල්ලතුරෙහි සින්නතම්බි යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිහතර ලක්ෂ තිස්දහස් විසිහතයි ශත පනස්නවයක (රු. 24,30,027.59) මුදලක් 2008 මැයි මස 31 වැනි දින වන විට, සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 24,30,027.59 මුදල ද, 2008 ජූනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇතන්ම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 675 බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

උතුරු පළාතේ, වවුනියාව දිස්ත්‍රික්කයේ, වවුනියාව දකුණ, වවුනියාව ආදායම් නිලධාරීගේ කොට්ඨාසයේ වවුනියාව නගර සභා සීමාව තුළ පදනිච්චුපුලියම්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පදනිච්චුවිලියම්කුලම් හි පිහිටි බලයලත් මිනින්දෝරු එස්. නාගරත්නම් විසින් සාදන ලද 2006.07.24 දිනැති අංක 0637 දරන සැලැස්මේ ලොට් 01 ලෙස පෙන්නුම් කරනු ලබන (බලයලත් මිනින්දෝරු වී. එස්. විශ්වනාදන් විසින් 2004.07.11 දිනැති අංක 1136බී දරන සැලැස්මේ සඳහන් ලොට් 15හි මැනීමක් වන) ඉටිඩිකාඩු නමැති බෙදා වෙන් කරන ලද පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) ඉම්පීරියල් පරිමාණය බිංදුවයි දශම බිංදුවයි තුනයි හතයි නවයක් (0.0379 හෙක්ටයාර්) කට සමාන ඉඩම් කොටසට මායිම්, උතුරට : පෙර කී අංක 1136බී දරන සැලැස්මේ ලොට්ස් 8 සහ 13 ද, නැගෙනහිරට : පෙර කී අංක 1136බී දරන සැලැස්මේ ලොට් 14 ද, දකුණට : ස්ටෙල්ලාගේ දේපල සහ බස්නාහිරට : උවසන් කප්පුඩියාර් සහ තවත් අයගේ දේපළ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

04-551/1

සම්පත් බැංකුව - පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0050 5000 2243.

2007 ජනවාරි මස 25 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කලුතර, නාගොඩ, අංක 1050හි විදාන පතිරනගේ රෝහන ලසන්ත සහ කලුතර, නාගොඩ නිලූකා හෝටලයේ විදාන පතිරණගේ ලක්ෂ්මන්, කඳලිපිටිය කංකානම්ගේ නන්දාවතී හා දියෝගු ආරච්චිගේ සුරංගිකා ප්‍රියදර්ශනී සිල්වා යන අය බන්ධනදායින් වශයෙන් සහ ඉහත කී කලුතර නාගොඩ අංක 1050හි විදාන පතිරණගේ රෝහන ලසන්ත යන අය උකස්කරු වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2003 නොවැම්බර් මස 05 දාතම හා අංක 1123 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය ඇපසට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම් පැහැර හැරීමේ හේතුවෙන් 2006 නොවැම්බර් මස 13 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙලක්ෂ හැටනව දහස් දහනවයකුත් ශත හැත්තෑපහක (රු. 2,69,019.75ක් පමණයි) එකී ණය පහසුකම් මත හිඟව ඇති මුළු මුදල වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතු ඇති හෙයින් එකී රුපියල් දෙලක්ෂ හැට නවදහස් දහනවයකුත් ශත හැත්තෑපහක (රු. 2,69,019.75ක් පමණයි) සම්පූර්ණ හිග මුදල සමග තවත් රුපියල් දෙලක්ෂ පහලොස් දහස් තුන්සිය පහකුත් ශත හතලිහක (රු. 2,15,305.40ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහනමය (19%) බැගින් 2006 නොවැම්බර් මස 14 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද, සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 1123 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, කලුතර තොටමුනේ, උතුර කලුතර බැද්දේ, දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ කොහොලාන පිහිටි කෝවිලඋඩවත්ත නොහොත් මහගොඩවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. එච්. අමරසිංහ විසින් සාදන ලද 1995 අගෝස්තු මස 05 දාතම හා අංක 544 දරන පිඹුරේ ලොට් අංක 02 වශයෙන් ලකුණු කොට නිරූපිත උතුරට : ලොට් අංක 1 ද, නැගෙනහිරට : මහ පාර ද, දකුණට : මෙම පිඹුරෙන් ඉවත් කොට ඇති ලොට් 4බී ද, සහ බස්නාහිරට : ලොට් 4සී පන්සල් ඉඩම ද මායිම් වන කලුතර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G95/280 යටතේ ලියාපදිංචි කොට ඇති එකී අංක 544 පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් විසිහතක් (අ. 0, රූ. 0, පර්. 27) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලුම සහන හා දාසත්ව ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගමේ ලේකම්.

04-554/3

සම්පත් බැංකුව පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුවේ පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1056 5002 3621 සහ 0056 5000 2301.

2007 සැප්තැම්බර් මස 28 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උඩුදුම්බර, ඉඳුනිල් එන්ටර්ප්‍රයිසස් හි ජඹුරේගොඩ පතිරණගේ තනුෂ නිල්දිය සහ අක්මීමණ මද්දුම ආචාරිගේ වසන්ත කුමාර යන දෙදෙනා බන්ධනදායින් වශයෙන් සහ ඉහත කී උඩුදුම්බර ඉඳුනිල් එන්ටර්ප්‍රයිසස් හි එකී ජඹුරේගොඩ පතිරණගේ තනුෂ නිල්දිය යන අය උකස්කරු වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සූනරි විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට පිළිවෙලින් ලියා සහතික කළ 2004 ජූනි මස 01 දාතම හා අංක 2736 සහ 2005 මාර්තු මස 01 දාතම හා අංක 348 දරන උකස් බැඳුම්කර මත මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපසට ගෙන ඔහු වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 මාර්තු මස 06 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අටලක්ෂ හයදහස් හාරසිය තිස්පහකුත් ශත අනූ හතරක් (රු. 8,60,435.94ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හා හිඟව ඇති හෙයින් එකී රුපියල් අටලක්ෂ හයදහස් හාරසිය තිස්පහකුත් ශත අනූ හතරක් (රු. 8,06,435.94ක් පමණයි) සම්පූර්ණ හිග මුදල සමග තවත් රුපියල් හත්ලක්ෂ හැටපන් දහස් අටසිය හතලිස් හයක (රු. 7,65,846ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහතුන (13%) බැගින් මාර්තු මස 07 වැනි දින සිට විකුණුම් දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් එකී අංක 2736 සහ 348 බැඳුම්කර මත සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, නවඋඩුදුම්බර කෝරලේ බටහිර ගම්පහ කෝරලේ සහ උඩුදුම්බර ප්‍රාදේශීය සභා සීමාව තුළ මැදිවන පිහිටි කනහම්පිටියෙවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පී. පුංචිහේවා විසින් සාදන ලද 2003 ඔක්තෝබර් මස 25 දාතම හා අංක 1893 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කොට නිරූපිත මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව M 64/208හි ලියාපදිංචි කළ එකී අංක 1893 පිඹුරට අනුව ඊසාන දෙසින් F. V. P. 434 පිඹුරේ ලොට් 163 සහ මාදුගොඩ මහවෙල ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : F. V. P. 34හි ලොට් 155 ලෙස ලකුණු කොට ඇති ඇළ ද, දකුණට : අංක 1893 පිඹුරේ ලොට් 2 සහ F. V. P. 434 හි ලොට් අංක 149, 154, හා 13හි වැට සහ මායිමද සහ බටහිරට : F. V. P. 434හි ලොට් 150හි මායිම සහ ඇළ ද, මායිම්වන ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් තිස්නවයක් (අ. 1, රූ. 3, පර්. 39) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ ඉඩම එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සහ එයට අදාළ සියලු අයිතීන්, මාර්ග වරප්‍රසාද සහන හා දාසත්ව ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගමේ ලේකම්.

04-554/2

ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නාලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් චාන්දනී මායාදුන්නේ විසින් ලියා සහතික කරන ලද අංක 444 හා 1998 ජනවාරි මස 26 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "අමරා ග්‍රේන් සෙන්ටර්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන රත්නායක මුදියන්සේලාගේ අමරාවතී රත්නායක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 444 දරන උකස් බැඳුම්කරය මත එකී රත්නායක මුදින්සේලාගේ අමරාවතී රත්නායක යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දසලක්ෂ දහඅට දහස් එකසිය හැත්තෑ පහකුත් ශත හැත්තෑවක (රු. 10,18,175.70) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දෙලක්ෂ අසූනව දහස් හයසිය අනූහයක් (රු. 2,89,696) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දසලක්ෂ දහඅට දහස් එකසිය හැත්තෑ පහකුත් ශත හැත්තෑවක (රු. 10,18,175.70) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දෙලක්ෂ අසූනව දහස් හයසිය අනූහයක් (රු. 2,89,696) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 444 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 444 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

උතුරුමැද පළාතේ, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එප්පාවල කෝරළේ, අංක 447 ග්‍රාම නිලධාරි වසමේ, රොටවැව ග්‍රාමයේ පිහිටි, සර්වේයර් ජනරාල්වරයා විසින් මැන සාදන ලදුව, ඔහු භාරයේ තිබෙන අංක FVP434 දරන අවසාන ගම් පිඹුරේ අංක 4 දරන ක්ෂේත්‍ර පත්‍රයේ, ලොට් අංක 441 දරන බිම් කට්ටිය වන උතුරට : පාර සඳහා වෙන් වූ බිම ද, නැගෙනහිරට : ලොට් අංක 438 සහ පාර සඳහා වෙන් වූ බිම ද, දකුණට : ලොට් අංක 442 සහ 440 ද, බස්නාහිරට : පාර සඳහා වෙන් වූ බිම් ද යන මායිම් ඇතුළත රූඩ් දෙකකුත් පර්චස් දහහතක් (අ. 0, රූ. 2, පර්. 17) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ. මෙම ඉඩම අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලුපාර,
කොළඹ 3
04-572/5

ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට බදුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද අංක 1725 හා 2006 දෙසැම්බර් මස 11 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "ඉරේෂා නිෂ්පාදන" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන වැලිමඩ, සව්කෙන්ද මුදියන්සේලාගේ රාජරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ජනවාරි මස 31 වැනි දිනට ඉහත කී අංක 1725 දරන උකස් බැඳුම්කරය මත එකී සව්කෙන්ද

මුදියන්සේලාගේ රාජරත්න යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හයලක්ෂ පනස් හතර දහස් අටසිය විසි හතකුත් ශත අසූ තුනක (රු. 6,54,827.93) මුදලක් සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ හැටහය දහස් නවසිය විසි හයකුත් ශත අටක් (රු. 5,66,926.08) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි මස 1, අප්‍රේල් මස 1, ජූලි මස 1 සහ ඔක්තෝබර් මස 1 යන දින වලදී ප්‍රතිශෝධනය කරන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හයලක්ෂ පනස් හතර දහස් අටසිය විසි හතකුත් ශත අනූ තුනක (රු. 6,54,827.93) මුදලක් සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ හැටනව දහස් නවසිය විසි හයකුත් ශත අටක් (රු. 5,66,926.08) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි මස 1, අප්‍රේල් මස 1, ජූලි මස 1 සහ ඔක්තෝබර් මස 1 යන දින වලදී ප්‍රතිශෝධනය කරන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1725 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 1725 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹවිනි පළාත් කෝරළේ, මැදගෙදරගම ග්‍රාමයේ පිහිටි හෙලකඩවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු එස්. පී. රාජනායක විසින් මැන සාදන ලද අංක 1981 හා 2000.10.22 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : පාර (එච්) ද, නැගෙනහිරට : ආර්. එම්. සෝමරත්න හිමිකම් කියන ඉඩම ද, දකුණට : ආර්. එම්. සෝමරත්න හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : ලොට් අංක 2 ද යන මායිම් ඇතුළත පර්චස් විස්සකුත් දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 20.01) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලුපාර,
කොළඹ 3
04-572/6

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 19/0/00/01698.

ණයකරුගේ සම්පූර්ණ නම : බ්‍රාහ්මණ ආරච්චිගේ සුරංජිත් රංග.

කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එම්. ටී. ආර්. ආර්. විජේසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 72 හා 1999.02.22 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස්දහස් තිස්නවයයි ශත පනස්අටක (රු. 2,30,039.58) මුදලක් වර්ෂ 2003.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අසූතුන්දහස් නවසිය හැටඑකයි ශත අනූහතරක (රු. 1,83,961.94) මුදල ද වර්ෂ 2003.04.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් හතලිස්හයදහස් හැත්තෑහතයි ශත හැටහතරක් (රු. 46,077.64) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ තිස්දහස් තිස්නවයයි ශත පනස්අටක (රු. 2,30,039.58) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අසූතුන්දහස් නවසිය හැටඑකයි ශත අනූහතරක (රු. 1,83,961.94) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50%බැගින් වන පොලියක් 2003.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දකුණු කටුගම්පල් කෝරළේ, කටුගම්පල හත්පත්තුවේ, බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාවේ හොරම්බුගම ග්‍රාමයේ හි පිහිටි බුළුගහවත්ත හා කහටගහවත්ත නමැති ඉඩමට 1994.07.21 හා 1998.08.25 දිනයන් හි එම්. ජේ. ගෝමස් මානක තැන විසින් මැන සම්පාදිත අංක 1329 පිඹුර ප්‍රකාර ලොට් 1සී ට මායිම්, උතුරට : ලොට් 1බී (මාර්ග රක්ෂිතය) ද, නැගෙනහිරට : ඊ. එම්. බබාසිංහ හා ආර්. අයි. ප්‍රනාන්දු පුල්ලේගේ උරුමකරුවන්ගේ ඉඩම ද, දකුණට : ආර්. අයි. ප්‍රනාන්දු පුල්ලේගේ උරුමකරුවන්ගේ ඉඩම ද, බටහිරට : මර්තේලිස් අප්පුහාමි හා ජේම්ස් නයිදේගේ ඉඩම් ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් තිස්දෙකයි දශම පහක් (අ. 0, රූ. 1, පර්. 32.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලුදේද මාර්ග පරවශතාවය ද සමග කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 140/276හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2003ක් වූ ජූනි මස 26 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

04-585

මුද්‍රණය හා බෙදාහැරීම සීමාසහිත ශ්‍රී ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk